**ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය - 2018**

**------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------------**

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාර්යාංශය විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු.61,565,855 ක ගොඩනැගිලි කුලිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | කාර්යාංශය හා අධිකාරිය අතර ගොඩනැගිලි කුලී සම්බන්ධයෙන් නෛතිකව මේ දක්වා එකඟතාවයකට ගිවිසුමක් අත්සන් කර නොමැති අතර ඉදිරියේදී දෙපාර්ශවය අතර ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු කුලිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු බව. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| තානාපති කාර්යාල 12 ක් සඳහා ලබා දුන් නොපියවූ අත්තිකාරම් | 31,131,053 | ශේෂ සනාථ කිරීම් | මෙම ශේෂය තහවුරු කර ගැනීම සඳහා මේ වන විට කාර්යාංශය කටයුතු කරමින් පවතී. | අදාළ ශේෂ සනාථ නොපමාව ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 1,060,254,984ක් වූ ශේෂය තුළ වර්ෂ 4 කට වැඩි කාලයක සිට හිඟව පැවැති ශේෂය රු. 3,304,920 ක් විය. | වර්ෂ 04 කට වැඩි කාලයක් ලෙස දක්වා ඇති රු. 3,304,920 ක ශේෂය 2016 අවසන් ගිණුම් වලදී අඩමාණ ණය වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත කොට ඇත. සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටුව ඉදිරිපත් කිරීමෙන් පසු එහි අනුමැතිය මත එම ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගත යුතු බව |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබූ ශේෂවලින් රු. 8,103,211 ක් වර්ෂ 03 ට වැඩි කාලයක සිටද, රු. 2,344,090 ක් වර්ෂ 03 ට අඩු කාලයක සිටද පවතින ණයහිමි ශේෂයන්ගෙන් සමන්විත වී තිබුණි. | මෙය හඳුනාගැනීමෙන් පසු සංචාරක සංවර්ධන අධිකාරය දැනුවත් කර ඇති අතර දෙපාර්ශවයේ එකඟතාවය මත ඉදිරියේ කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් ගෙවා අවසන් කළ යුතු බව |

## 1.7 නීතිරීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ VII පරිච්ඡේදයේ 40 වගන්තියේ 09 උප වගන්තිය | වගන්තිය ප්‍රකාරව සෑම ලිත් වර්ෂයක් අවසානවී මාස තුනක් ඉකුත් වීමට පෙරාතුව එම වර්ෂය තුළ කාර්යාංශයේ කටයුතු පිළිබඳව ඉදිරිපත්කළ යුතු වාර්තා, ප්‍රකාශනයන් සහ සැලැසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය හා එකඟවන අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කරනු ලැබේ. | පනතේ විධි විධාන ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු වාර්තා ප්‍රකාශන හා සැලසුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කල යුතු බව |

| | | | |
|---|---|---|---|
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) මුදල් රෙගුලාසි 102 හා 104 | වටිනාකම රු. 308,700 ක් වන ලැප්ටොප් පරිගණක තුනක් නැති වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි | එහිදී මතභේදයට තුඩු දුන් හඳුනා නොගත් භාණ්ඩ විමර්ෂණය සඳහා මානව සම්පත් හා පාලන අංශය වෙත දැනුම් දී ඇත. | හානි සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ii) මුදල් රෙගුලාසි 169(2) | 2016 වර්ෂයේදී අගරු වූ වටිනාකම රු. 220,000 ක් වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම මුදල අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අගරු වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (iii) මුදල් රෙගුලාසි 757 | සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2018 වර්ෂයට අයත් ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තාව මේ වන විට අවසන් කර ඇත. | නියමිත කාල වකවානු තුළ ස්ථාවර වත්කම් සමීක්ෂණය සිදු කළ යුතු බව |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,675,032,291 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,929,150,032 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 254,117,741 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ අපගමන බදු ආදායම රු. 312,299,139 කින් ඉහළ යෑමට ප්‍රතිරූපව වෙළඳ වියදම් රු. 508,510,397 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රටවල් 6 ක් වෙනුවෙන් සංචාරක ප්‍රවර්ධනය සඳහා දරන ලද වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණද, එම රටවල සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධන වේගය සමාලෝචිත වර්ෂය තුලදී පහත වැටී තිබුණි. | චීනයේ සුපිරි සංචාරක සල්පිලක් සඳහා සහභාගී වීම, ඉන්දුනීසියාවේ හා තායිලන්තයේ සංචාරක සල්පිල් සඳහා කුටි සකස් කිරීම හා මැලේසියාවේ කරනු ලබන වැඩසටහන්වලට අමතරව විශේෂ උළෙලක් පැවැත්වීම හේතුවෙන් වියදම් ඉහළ ගොස් ඇති බව. | සංචාරකයින්ගේ පැමිණීමේ වර්ධන වේගය වැඩි කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ආ) ක්‍රියාකාරී සැලසුමට අනුව සමාලෝචිත වර්යේදී ලෝකයේ ප්‍රධාන රටවල් 28 ක් තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ අලෙවි ප්‍රවර්ධන ඉසව් ගණන 152 ක් වූ අතර එයින් නිම කර තිබූ සංඛ්‍යාව 89 ක් විය. | එක්සත් ජනපදය, මැලේසියාව, ජර්මනිය, ප්‍රංශය, ඕස්ට්‍රෙලියාව, ජපානය, ස්කැන්ඩිනේවියානු, ස්විට්සර්ලන්තය, ඔස්ට්‍රියාව ආදී රටවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ බාහිර ප්‍රචාරන වැඩසටහන් සහ පාරිභෝගික වෙළඳ සල්පිල් ක්‍රියාත්මක නොකලේ, අවස්ථානුකූලව ගත් කළමනාකරණ තීරණ මතය. | ක්‍රියාකාරී සැලස්ම ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |